# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,469 - 2025 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2025.12.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 534 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 542 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 16 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 02 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජුනි මස 09 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


533 - B 082749 - (2025/12)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 (අ) වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

නැගෙනහිර පළාත් සභාවේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) නඩරාජා අරුඩ්වෙල්වන් වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1988 මාර්තු මස විසිහතර දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/20700 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සමන් පුර පදිංචි, හතුරුසිංහ මුදියන්සේලාගේ මානෙල්හාමි වෙත ප්‍රදානය කොට ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LD/B/3/69 යටතේ 1999.09.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නිත්‍යානුකූලව අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩ්ඩුකුලම් පත්තුවේ 31 ඩී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සමන්පුර නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ජ. සි. ත්‍රි 72 දරන ක්ෂේත්‍ර අංක 40 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි (01) පර්චස් එකයි (01) විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 41, 33 සහ 34 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 39 සහ 34 |
| *දකුණට* | : කැබලි අංක 39 සහ 49 |
| *බස්නාහිරට* | : කැබලි අංක 49 සහ 41 |

එන්. අරුඩ්වෙල්වන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් කාර්යාලය
(අන්තර් පළාත්) ත්‍රිකුණාමලය.

2025 ඔක්තෝබර් මස 29 වැනි දින.

12-444

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් වර්ණකුල ආදිත්ත සෙම්බුකුට්ටිගේ චමිලා ගීතානි ජාන්ස වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996ක් වූ දෙසැම්බර් මස 16 වන දින ප්‍රදානය කර ඇති අංක පුත්/නාත්/ප්‍ර/51654 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඉද්දමල්ගම, නාත්තන්ඩිය පදිංචි ජගත් සුසන්ත සිල්වා වෙත ප්‍රදානය කොට මාරවිල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක පුත්/නාත්/22/76 යටතේ 1997.03.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 වන දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරලේ 508 බී, මැද නාත්තන්ඩිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මරඳ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, පුත්තලම මැනුම් අධිකාරී භාරයේ ඇති - ප්‍රමාණයෙන් පර්චස් 10ක විශාලතාවය ඇත්තාවූද, ඉද්දමල්ගම නව ජනපදය නැමැති රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : රජයේ පොදු ඉඩම |
| *නැගෙනහිරට* | : යෝජිත පාර |
| *දකුණට* | : යෝජිත පාර |
| *බස්නාහිරට* | : ජුඩ් ලීමස් පදිංචි ඉඩම |

ඩබ්. ඒ. එස්. සී. ගීතානි ජාන්ස,
ප්‍රාදේශීය ලේකම්,
නාත්තන්ඩිය.

2025 ජුනි මස 25 වැනි දින.
නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12-551

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් එච්. එම්. නදීජා හේරත් වන මම ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 අප්‍රේල් මස 30 වන දින ප්‍රදානය කර ඇති අංක පුත්/වෙන්/ප්‍ර/713 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බොරලැස්ස 'පිරිස්වත්ත *නොහොත්* ගාලවත්ත ජනපදයේ පදිංචි අබේනායක මුදියන්සේලාගේ ලොරෙන්සු පෙරේරා වෙත ප්‍රදානය කොට මාරවිල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක පුත්/වෙන්/13/25 යටතේ 1993.09.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරළයේ නැගෙනහිර බොරලැස්ස (පෙර - බොරලැස්ස) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ බොරලැස්ස නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක එස්ශූපී. ඊ අයි 21/6, දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පුත්තලම මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක පී. පී. ඒ. 1692 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 45 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇති ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දශම අටක (රූඩ් 01, පර්චස් 0.8) විශාල පිරිස්වත්ත *නොහොත්* ගාලවත්ත නමැති රජයේ ඉඩම

| | |
|---|---|
| *උතුරට* | : කැබැලි අංක 44 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 46 |
| *දකුණට* | : කැබලි අංක 76 |
| *බස්නාහිරට* | : කැබලි අංක 24 |

එච්. එම්. නදීජා හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
වෙන්නප්පුව.

2025 අප්‍රේල් මස 16 වැනි දින.

12-552

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

වයඹ පළාත් සභාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/ලේක්ෂිකා මිගෙල් ආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2001.08.20 දින ප්‍රදානය කර ඇති අංක පුත්/මකු/ප්‍ර/72125 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කිවුල තරුණ ව්‍යාපාරය, මදුරන්කුලිය පදිංචි මැණික් ආරච්චිලාගේ කරුණාරත්න වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 251/44 යටතේ 2022.01.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ මහකුඹුක්කඩවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රාජකුමාර වන්නි පත්තුවේ/කෝරළේ 614/බී කිවුල තරුණ ව්‍යාපාරය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කිවුල තරුණ ව්‍යාපාරය නමැති ගමේ ඇත්තාවූ ද, පුත්තලම මැනුම් අධිකාරී භාරයේ ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක එෆ්. ටී. පී. 1-53 දරන රේඛා සටහනේ අංක 1495 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 0.328 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. :

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 1489 (පාර) |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 1497, 1496, 1500 |
| *දකුණට* | : කට්ටි අංක 1496, 1500 |
| *බස්නාහිරට* | : කට්ටි අංක 1494 |

ආර්. පී. නවම් උදානි,
ප්‍රාදේශීය ලේකම්,
මහකුඹුක්කඩවල.

2024 ජනවාරි මස 24 වැනි දින.

12-553

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

උතුරුමැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් නානායක්කාර සෙනෙවිරත්න අප්පුහාමිලාගේ කසුන් දීප්ති සෙනෙවිරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.27 දින ප්‍රදානය කර ඇති අංක අනු/මැද/ප්‍ර/005996 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කරම්බන්කුලම, මැදවච්චිය පදිංචි කපුරාලගේ ධනහාමි වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 18748 යටතේ 1997.09.02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවත් කෝරළේ අංක 76 කරම්බන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කරම්බන්කුලම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ගොඩ ඉඩමට මායිම් :

*උතුරට* : කැදැව ප්‍රධාන පාර රක්ෂිතය
*නැගෙනහිරට* : බෞද්ධසාරගේ ඉඩම
*දකුණට* : පී. බී. කරුණාරත්නගේ ඉඩම
*බස්නාහිරට* : කේ. හේරත්හාමිගේ ඉඩම

එන්. එස්. ඒ. කේ. ඩී. සෙනෙවිරත්න,
ප්‍රාදේශීය ලේකම්,
මැදවච්චිය.

2025 ඔක්තෝබර් මස 31 වැනි දින.

12-554/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි.

උතුරුමැද පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඇලබොඩ ගෙදර උපාලි රාජපක්ෂ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.11.20 දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/3715 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාජාංගනය, යාය 2 පදිංචි විතානගේ මැන්දිරිස් පෙරේරා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික්කයේ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 3229 යටතේ 1997.03.04 දින 153/29 පිටුවේ ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එප්පාවල කෝරළේ 443 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යාය 02, රොටවැව නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 07 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. සි. අ. 434 දරන රේඛා සටහනෙහි අංක 771 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02 (දෙකයි) පර්චස් 18 (දහඅටක්) විශාලත්වය ඇත්තාවූද, පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම : (ගොඩ)

*උතුරට* : අංක 731 මාර්ග රක්ෂිතය,
*නැගෙනහිරට* : අංක 772 ඉඩම,
*දකුණට* : අංක 773 ඉඩම,
*බස්නාහිරට* : අංක 770 ඉඩම,

ඊ. පී. උපාලි රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2025 මාර්තු මස 07 වැනි දින.

12-554/2

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරුමැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'බී' කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර පාඩි ගමගේ නොයෙල් ජයසිරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2002.02.20 දින ප්‍රදානය කර ඇති අංක පො/බී/දිඹු/ප්‍ර/23(ගොඩ) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කාශ්‍යපපුර, තිස්පනේගම, අංක 13 ලිපිනයෙහි පදිංචි ජයසූරිය ආරච්චිලාගේ කරුණාරත්න වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 6/11/07 යටතේ 2002.04.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එගොඩ පත්තුවේ/මහඋල්පත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහඋල්පත නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක අ. ජ. පි. පො. 236/01 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 161 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1890 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 158 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 70 |
| *දකුණට* | : කැබලි අංක 169 |
| *බස්නාහිරට* | : කැබලි අංක 162 |

පී. ජී. නොයෙල් ජයසිරි,<br>
නේවාසික ව්‍යාපාර කළමණාකාර,<br>
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,<br>
බී - කලාපය, වැලිකන්ද.

2025 ජූලි මස 21 වැනි දින.

12-558/1

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරුමැද පළාත් සභාවේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ/ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 'බී' කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර පාඩි ගමගේ නොයෙල් ජයසිරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2002.02.20 දින ප්‍රදානය කර ඇති අංක පො/බී/දිඹු/ප්‍ර/24(වාරි) දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කාශ්‍යපපුර, තිස්පනේගම, අංක 13 ලිපිනයෙහි පදිංචි ජයසූරිය ආරච්චිලාගේ කරුණාරත්න වෙත ප්‍රදානය කොට පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 6/11/08 යටතේ 2002.04.01 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එගොඩ පත්තුවේ මහ උල්පත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහඋල්පත නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක ක. ඉ. සි. 120006 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 58 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0050 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 57 |
| *නැගෙනහිරට* | : කැබලි අංක 51 හා 59 |
| *දකුණට* | : කැබලි අංක 59 හා 62 |
| *බස්නාහිරට* | : කැබලි අංක 02 හා 57 |

පී. ජී. නොයෙල් ජයසිරි,<br>
නේවාසික ව්‍යාපාර කළමණාකාර,<br>
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,<br>
බී - කලාපය, වැලිකන්ද.

2025 ජූලි මස 21 වැනි දින.

12-558/2

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාතේ දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ජේ. ඒ. විජානි වසන්තිකා වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1983 අප්‍රියෙල් මස 07 වන දින ප්‍රදානය කර ඇති පුත්/වෙන්/ප්‍ර/4086 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දකුණු කිරිමැටියාන, ලුණුවිල පදිංචි අන්තෝනි පෙරේරාගේ ආතර් පෙරේරා වෙත ප්‍රදානය කොට මාරවිල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක පුත්/වෙන්/9/39 යටතේ 1992.05.21 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

පුත්තලම දිස්ත්‍රික්කයේ දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු පිටිගල් කෝරලේ දකුණු කිරිමැටියාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු කිරිමැටියාන නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අයි 16/55-63 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි පුත්තලම මැනුම් අධිකාරි විසින් සම්පාදිත අංක පි. පි.පු. 2131 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 101 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.097ක් විශාල වැරැල්ලකැලේවත්ත නමැති රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : පි. පි. පු. 2131 පිඹුරෙහි කැබලි අංක 98 |
| *නැගෙනහිරට* | : පි. පි. පු. 2131 පිඹුරෙහි කැබලි අංක 102 |
| *දකුණට* | : පි. පි. පු. 2131 පිඹුරෙහි කැබලි අංක 131 |
| *බස්නාහිරට* | : පි. පි.පු. 2131 පිඹුරෙහි කැබලි අංක 131 |

ජේ. ඒ. විජානි වසන්තිකා,
ප්‍රාදේශීය ලේකම්,
දන්කොටුව.

2025 ජූනි මස 30 වැනි දින.

12-565

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් එම්. ඒ. අයි. එච්. පෙරේරා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.11.04 දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර 17505 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නාරකුඩි විල්ලුව, බත්තුළුඔය පදිංචි වැහෙන්දාගේ දොන් ජුසේ අප්පුහාමි වෙත ප්‍රදානයකොට හලාවත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ආර 04/996 යටතේ 1991.03.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිලුන්දන් පත්තුවේ. පුලිච්චිතුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තාරකුඩි විල්ලුව නමැති ගමේ පිහිටා ඇත්තා වූ අංක මු. පි. පු. 503 දරන පිඹුරේ කට්ටි අංක 208 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසිපහක් (අක්කර 01 රූඩ් 01 පර්චස් 25) විශාලත්වය ඇත්තා වූ ද පහත පරිදි මායිම් වන රජයේ ඉඩම :

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 207 |
| *නැගෙනහිරට* | : කට්ටි අංක 102 පාර |
| *දකුණට* | : පු 545/15 |
| *බස්නාහිරට* | : කට්ටි අංක 210 සහ 211 |

එම්. ඒ. අයි. එච්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2025 සැප්තැම්බර් 05 වැනි දින.

12-568

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කේ. ඩී. ඒ. කැරුව්ගොඩ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 ජුනි දෙවන දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර/6240 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නවගත්තේගම පදිංචි දිසානායක මුදියන්සේලාගේ වන්නිහාමිගේ කළුබණ්ඩා වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 37/129 යටතේ 1994.05.26 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති සහ පසුව පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 37/129 යටතේ 1997.06.12 වන දින නවගත්තේගම පදිංචි වන්නිනායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩාගේ මුතුමැණිකා යන අය වෙත මුල් හිමිකම ලබා දී ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිමැටියාව පත්තුවේ/කෝරලේ 644 කිරිමැටියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තල්ගස්වැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 3442 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 89 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 1.307 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ගොඩ ඉඩම :

*උතුරට* : කට්ටි අංක 96
*නැගෙනහිරට* : කට්ටි අංක 96
*දකුණට* : කට්ටි අංක 96 සහ 90
*බස්නාහිරට* : කට්ටි අංක 90 සහ 96

කේ. ඩී. ඒ. කැරුව්ගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම.

2024 ජනවාරි 19 වැනි දින.

12-569/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කේ. ඩී. ඒ. කැරුව්ගොඩ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986 ජුනි දෙවන දින ප්‍රදානය කර ඇති අංක පුත්/ප්‍ර/6241 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන නවගත්තේගම පදිංචි දිසානායක මුදියන්සේලාගේ වන්නිහාමිගේ කළුබණ්ඩා වෙත ප්‍රදානය කොට පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 37/130 යටතේ 1994.05.26 වන දින ලියාපදිංචි කරනු ලැබ ඇති සහ පසුව පුත්තලම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 37/130 යටතේ 1997.06.12 වන දින නවගත්තේගම පදිංචි වන්නිනායක මුදියන්සේලාගේ උක්කුබණ්ඩාගේ මුතුමැණිකා යන අය වෙත මුල් හිමිකම ලබා දී ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයේ නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිරිමැටියාව පත්තුවේ/කෝරලේ 644 කිරිමැටියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තල්ගස්වැව නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, පුත්තලම මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති අංක අ. ග. පි. 3442 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 98 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.740 ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ගොඩ ඉඩම :

*උතුරට* : කට්ටි අංක 97
*නැගෙනහිරට* : කට්ටි අංක 97
*දකුණට* : කට්ටි අංක 101
*බස්නාහිරට* : කට්ටි අංක 101

කේ. ඩී. ඒ. කැරුව්ගොඩ,
ප්‍රාදේශීය ලේකම්,
/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්
(අන්තර් පළාත්)
නවගත්තේගම.

2024 ජනවාරි 19 වැනි දින.

12-569/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වින්ධ්‍යා ඩී. සමරක්කොඩි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.05.25 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/3709 දරන ප්‍රදාන පත්‍රයෙහි හිමිකරු වන හීනිපැල්ල පදිංචි රන්දෙනියගේ රන්හාමි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO-381 යටතේ 1983.04.07 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කන්දබඩ පත්තුවේ හීනිපැල්ල ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, හීනිපැල්ල නමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ. ග. පි. 80 දරන පිඹුරෙහි අංක 365 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 01 ක් විශාලත්වය ඇතැයි ගණන් බලා තිබෙන මැදකුට්ටිය යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

*උතුරට* : අ. ග. පි. 80 හි අංක 81 සහ 80 කැබලි
*නැගෙනහිරට* : අ. ග. පි. 80 හි අංක 359 කැබැල්ල,
*දකුණට* : අ. ග. පි. 80 හි අංක 364, 361 සහ 360 කැබලි
*බස්නාහිරට* : අ. ග. පි. 80 හි අංක 366 කැබැල්ල

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2025 මැයි මස 22 වැනි දින.

12-584/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වින්ධ්‍යා ඩී. සමරක්කොඩි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1986.02.25 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/9982 දරන ප්‍රදාන පත්‍රයෙහි හිමිකරු වන දේවාලේගම පදිංචි ගමාච්චිගේ කිරිගෝරිස් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO-1696 යටතේ 1986.09.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කන්දබඩ පත්තුවේ දේවාලේගම ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, දේවාලේගම නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ. ග. පි. 165 දරන පිඹුරෙහි අංක 418 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4347 ක් ඇතැයි ගණන් බලා තිබෙන මැදමණ්ඩියහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :

*උතුරට* : අ. ග. පි. 165 හි 13ඒවී, කැබැල්ල
*නැගෙනහිරට* : අ. ග. පි. 165 හි 13ඒ යූ 1, කැබැල්ල
*දකුණට* : අ. ග. පි. 165 හි 13ඒ යූ 3, 13ඒ යූ 2, කැබැලි
*බස්නාහිරට* : අ. ග. පි. 165 හි 417 කැබැල්ල

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2025 මැයි මස 22 වැනි දින.

12-584/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. ප්‍රාදේශීය ලේකම් ඒ. ජී. ඩබ්. ටී. රාජපක්ෂ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනපති විසින් 1996 මැයි මස 17 වන දින ප්‍රදානය කර ඇති මාර/10/ප්‍ර 33879 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කිරින්ද පුහුල්වැල්ල පදිංචි මනම්පේරිගේ ඇල්බට් මහතා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/1062 යටතේ 1997.03.06 දින ලියාපදිංචි කරනු ලැබූ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

දකුණු පළාතේ මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගහබඩ පත්තුවේ වතුකොලකන්ද නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වලකන්ද නැමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මු. පි. මා. ර 1021 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 24 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.210 විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : කැකිරිවරාකනත්ත

| | |
|---|---|
| *උතුරට* | : කැ. අං. 23 |
| *නැගෙනහිරට* | : කැ. අං. 25 |
| *දකුණට* | : මු. පි. මාර 933/1 |
| *බස්නාහිරට* | : මු. පි. 12862/2 |

අංක මු. පි. මාර 1021 දරන පිඹුරු අංක 1 දරන කට්ටි කැබීමේ පිඹුර/ අංක.... ....... )

ඒ. ජී. ඩබ්. ටී. රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින.

12-584/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. ප්‍රාදේශීය ලේකම් ඒ. ජී. ඩබ්. ටී. රාජපක්ෂ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනපති විසින් 1983 අප්‍රේල් මස 27 වන දින ප්‍රදානය කර ඇති මාතර/ප්‍ර/6227 දරන දීමනා පත්‍රයේ හිමිකරු වන වලකන්ද පදිංචි හෙට්ටිආරච්චිගේ ජේම්ස් අප්පු මහතා වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/247 යටතේ 1987 ජුනි මස 29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2026.01.16 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

දකුණු පළාතේ මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ, ගහබඩපත්තුව උතුර කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ ගහබඩ පත්තුවේ වලකන්ද ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ වලකන්ද නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක 0, 25/05, 13 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මාර 1042 දරන පිඹුරෙහි අංක 16 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් රූඩ් 02 පර්චස් 06ක් ඇතැයි ගනන් බලා තිබෙන වතුබැද්ද යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | |
|---|---|
| *උතුරට* | : මු. පි. මාර. 1042 හි 12 කැබැල්ල |
| *නැගෙනහිරට* | : මු. පි. මාර. 1042 හි 13, 15 කැබලි |
| *දකුණට* | : මු. පි. මාර 1042 හි 10 කැබැල්ල |
| *බස්නාහිරට* | : මු. පි. මාර 1042 හි 17 කැබැල්ල |

ඒ. ජී. ඩබ්. ටී. රාජපක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින.

12-584/4

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77200.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : NP/28/04/SLO/LC/MAD/10*

21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුමලර්න්තාන් (MN/129) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මඩුපාර ගමේ ජනපද නිලධාරී විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් රූඩ් 01 පර්චස් 32 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා මේරි රොසලින් ආනන්දරාසා මිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

*උතුරට* : රජයේ ඉඩම්
*නැගෙනහිරට* : පාර
*දකුණට* : M. K. සන්තිරසේනගේ LDO ඉඩම්
*බටහිරට* : විමලසේනගේ LDO ඉඩම්.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ) බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.11.18 දින සිට 2055.11.17 දින දක්වා);

*(ආ) වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය,

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවු. 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2025.11.18 දින සිට අවුරුදු 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10%ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙම නිවේදනය *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 දෙසැම්බර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-583